# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/43 – 2017 ජනවාරි 20 වැනි සිකුරාදා – 2017.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, 225/සී, ගොංගිතොට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගොංගිතොට ගමේ පිහිටි, ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ගම්/ මහ/ 2014/ 402 හා 2014.11.28 දිනැති ප්‍රමාණයෙන් හෙක්. 0.0661 ක් පමණ වන පහත නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්.

01. කැබලි අක්ෂර 'ඒ ' – දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0661 ක් පමණ

උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි නම නොදන්නා ඉඩම; නැගෙනහිරට: බී. කේ. පියසේන හිමිකම් කියන නම නොදන්නා ඉඩම; දකුණට: මාර්ග (ප්‍රා.ස.); බටහිරට: පාර.

ජෝන් ඒ. ඊ. අමරතුංග,<br>ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2013/ඩී/283.<br>2016 නොවැම්බර් මස 29 වැනි දින,<br>ඉඩම් අමාත්‍යාංශය,<br>''මිහිකත මැඳුර'',<br>රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල.

02 - 194